# 1.15 කේවල සුරතාන්තයට ප්‍රතිපක්ෂ ව බහු සුරතාන්ත

ඉන්දික ෆර්ඩිනැන්ඩු, සෞම්‍ය ලියනගේ
නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07.

## ABSTRACT

ඇරිස්ටෝටල් සහ භරත යන පෙර,පර දෙදිග න්‍යායධරයන් දෙදෙනාගේ කතා වින්‍යාසකරණය පිළිබඳ ප්‍රවාද අතර සාම්‍යයක් පවතී. ඇරිස්ටෝටලියානු කතාවින්‍යාසය ප්‍රත්‍යාවර්තනය, ප්‍රත්‍යභිඥානය, අභිවර්ධනය වන අනිවාර්යතාව යනාදී සංකල්ප ඔස්සේ විග්‍රහ කෙරෙන අතර, භරත නාට්‍යයක ක්‍රියා විකාශනය ආරම්භ, යත්න, ප්‍රාප්ත්‍යාශා, නියතාප්ති, ඵලාගම යන අවස්ථා පසෙ හි පිහිටුවයි. මෙකී ද්විප්‍රවාදයෙහි ම ඇත්තේ එක්, කේවල උපරිමාවස්ථාවක් / සුරතාන්තයක් **(Climax)** පිළිබඳ සඳහනකි. වෙසෙසින් ම, මේ සමග ම ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයෙහි එන ත්‍රිවිධ ඒකත්වය, ආකුලීකරණය, අනාවරණය, කතාර්සීකරණය යන සහ සම්බන්ධී ප්‍රවාද දිශාභිමුඛ වන්නේ 'මිනිසා ස්ථිතික බව හා එහෙයින් ම මිනිසාගේ ඉරණම නොවෙනස් කළ හැකි අනිවාර්ය වූවක් බව' යන අධිකාරිවාදී දර්ශනය ස්ථාපිත කිරීම වෙත ය. එනයින් අවධාරණය කෙරෙන 'සාර්වික සත්‍යය' වන්නේ දේවල් පවතින ආකාරය සහ සිදුවන ආකාරය ස්වාභාවික බවයි. මානව ශිෂ්ටාචාරයේ ඉතිහාසය මෙවැනි ප්‍රවාදමය ස්වාභාවිකත්වයක් මත තීරණය වී සහ වර්ධනය වී පැමිණි බව පෙනේ. ඓතිහාසික ව ස්ථාපිත ස්වාභාවිකත්වය, පරම සහ සැබෑ ස්වාභාවිකත්වය බවට පත්වීමත්, ඊට අභියෝග කිරීමට ඉදිරිපත් නොවීමත් එපරිද්දෙන් ම ස්වාභාවික විය.

ක්‍රීඩනය **(Play)** තුළ කේවල උපරිමාවස්ථාවක් / සුරතාන්තයක් පමණක් අධිනිශ්චය වීම ඉහත ස්වාභාවිකත්වය ප්‍රතිබිම්බනය වීමක් ද? එය අධිනිශ්චය වන්නේ බහු උපරිමාවස්ථා / සුරතාන්ත **(Multiple Climax / Orgasm)** වලට ප්‍රතිපක්ෂවය. එනයින් කේවල උපරිමාවස්ථාව / සුරතාන්තය පිළිබඳ ප්‍රවාදය, පිළිවෙල - අපිළිවෙල / සංස්කෘතිය - අසංස්කෘතිය (ම්ලේච්ඡ / ගෝත්‍රික බව) / සංවිධිත බව - අසංවිධිත බව / පුරුෂභාවය - ස්ත්‍රීභාවය යන සහ සම්බන්ධ ප්‍රතිපක්ෂයන් හි ධනාත්මය නියෝජනය කරයි. එහි අන්‍යාලාපය වන්නේ බහු උපරිමාවස්ථා / බහු සුරතාන්ත පිළිබඳ ප්‍රවාදය මුඛ්‍ය කතිකාවෙන් විස්ථාපනය කැරෙන බවයි. අප යෝජනා කරන්නේ මීට ප්‍රතිපක්ෂ ව බහු උපරිමාවස්ථා / බහු සුරතාන්ත පිළිබඳ ප්‍රවාදය කරලියට ගෙන ආ යුතු බවයි. ඇරිස්ටෝටලියානු ප්‍රවාදය කරණ කොට, ප්‍රබන්ධ සාහිත්‍යයෙහි රස ජනනයෙහි තීරක සාධකයක් වන සන්දේහය ආත්ම කොට ගත් අනපේක්ෂිතභාවය, 'අපේක්ෂිත අනපේක්ෂිතභාවයක්' බවට පත්ව ඇති බවත්, අනපේක්ෂිතභාවය වඩා ප්‍රශස්ත තලයකට ඔසවා තැබීම සඳහා බහු උපරිමාවස්ථා / බහු සුරතාන්ත මෙහෙය කැඳවාගත යුතු බවත් අපි අවධාරණය කරමු.